**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය - 2013**

-----------------------------------------------------------------------

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13 (6) වගන්තිය ප්‍රකාර ඉදිරිපත් කළයුතු 2013 වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වනවිටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ.

**1.2 මුල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

------------------------------------------------------------

මණ්ඩලයේ මුල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**2. මුල්‍ය ප්‍රකාශන**

---------------

**2.1 මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මුල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2013 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 මුල්‍ය ප්‍රකාශන, පොත්පත් හා ලේඛන පැවැත්වීම**

-------------------------------------------------

මණ්ඩලයේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබුණද සමාලෝචිත වර්ෂයට අදාළ ගිණුම්, පොත්පත් හා ලේඛන සම්පූර්ණ කර නොතිබුණි.

**2.3 වත්කම් හා වගකීම්වල පැවැත්ම**

-------------------------------

මණ්ඩලය විසින් අවසන්වරට පිළියෙල කරන ලද 2011 දෙසැම්බර් 31 දිනට වූ මුල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **වත්කම්** | **වටිනාකම** |
|---|---|
| | **රු.** |
| ජංගම නොවන වත්කම් | 106,363,045 |
| ජංගම වත්කම් | 37,903,942 |
| මුළු වත්කම් | 144,266,987 |

| | |
|---|---|
| ජංගම බැරකම් | 3,798,759 |
| ජංගම නොවන බැරකම් | 24,329,669 |
| | -------------- |
| මුළු බැරකම් | 28,128,428 |
| ශුද්ධ වත්කම් / අයිතිය | 116,138,559 |
| | 144,266,987 |
| | ========= |
| මුළු ආදායම | 69,755,341 |
| මුළු වියදම | 83,884,690 |
| | -------------- |
| ඌනතාවය | 14,129,349 |
| | ======== |

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නිති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය iv වැනි පරිච්ඡේදයේ iii ආකෘතියේ ii වන ඡේදය | කාර්යක්ෂමතා කඩඉම් පිළිබඳ විස්තර පත්වීම් ලිපිවලට ඇතුළත් කර නොතිබුණි. |
| (ආ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 ඡේදය | ආයතනය විසින් ගෙවන ලද වැට් බදු සම්බන්ධයෙන් විගණකාධිපතිට පිටපතක් සහිතව දේශිය ආදායම් කොමසාරිස් වෙත වාර්තා කර නොතිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂයේ වාර්ෂික සැලැස්මට ඇතුළත් පහත සඳහන් කාර්යයන් 08 ක් ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(i) 2009 වර්ෂයේ සිට සැලසුම් කරනු ලබන ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය 1941 - 1961 , සාධිකාරි සිංහල ග්‍රන්ථ නාම ලේඛනය සහ ආයතන නාම සාධිකාරී ලේඛනය සම්පාදනය කර ප්‍රකාශයට පත් කිරීම.

(ii) ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය 2011 සමුච්චිත වෙළුම මාර්ගගත ප්‍රකාශනයක් ලෙස ඉදිරිපත් කිරීම.

(iii) ශ්‍රී ලංකා පශ්චාත් උපාධි නිබන්ධන අනුක්‍රමනිකාව 2007 – 2010 දෙවන වෙළුම ප්‍රකාශයට පත්කිරීම.

(iv) ශ්‍රී ලංකා පර්යේෂණ වාර්තා අනුක්‍රමනිකාව 2005 – 2009 තෙවන වෙළුම ප්‍රකාශයට පත්කිරීම.

(v) ජාතික පුවත්පත්වල විද්‍යුත් පිටපත් ලබාගැනීම.

(vi) අන්තර්ජාල ගවේෂණය මඟින් දුර්ලභ පිටපත් සංඛ්‍යාංක ක්‍රමයට ලබාගැනීම.

(vii) නීතිමය තැන්පතු නීතිය සංශෝධනය සඳහා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට නිර්දේශ ලබාදීම.

(viii) ජාතික පුස්තකාලයට අළුතින් ලබාගන්නා තොරතුරු ඇතුළත් ප්‍රකාශනයක් සකස්කර බෙදාහැරීම.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පුළුල් හා අංග සම්පූර්ණ ජාතික එකතුවක් ගොඩනැගීමේ ජාතික ඉලක්කය සපුරා ගැනීම පිණිස සුදුසු පොත්පත් හා වෙනත් වර්ගවල තොරතුරු මූලාශ්‍ර අත්පත් කරගැනීමේ ජාතික පුස්තකාලය සතු ප්‍රමුඛ කාර්යය සඳහා සමාලෝචිත වර්ෂයේ වෙන්කරන ලද රු.3,000,000 ක ප්‍රතිපාදනයෙන් රු.736,437 ක් හෙවත් සියයට 24 ක් ද, ජාත්‍යන්තර පොත් හුවමාරු ක්‍රමය යටතේ විදේශ ආයතනයන්ට පරිත්‍යාග කිරීම සඳහා පොත් මිලදී ගැනීමට වෙන්කළ රු.50,000 ක මුළු ප්‍රතිපාදනයමද උපයෝගී කරගෙන නොතිබුණි.

(ආ) පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන්හි අනාවරණය වූ දුර්වලතා පහත දැක්වේ.

(i) <u>තොග පාලනය</u>

- ❖ චක්‍රලේඛ ප්‍රකාරව 2013 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබීම.

- ❖ 2011 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් පහත සඳහන් දෝෂ නිවැරදි කර නොතිබීම.

  - මණ්ඩලය තුළ මුද්‍රණය කරනු ලබන මණ්ඩලීය ප්‍රකාශන හා පුස්තකාල ද්‍රව්‍යයන් විධිමත් ක්‍රමවේදයන්ට අනුව පිරිවැය හා අලෙවි වටිනාකම් ගණනය නොකිරීම.
  - අලෙවි කරනු ලැබූ එහෙත් ගිණුම්වලට ගැළපීම් නොකළ පොත් හා පුස්තකාල ලිපි ද්‍රව්‍යවල පිරිවැය ගිණුම්වලින් ඉවත් නොකිරීම,
  - වර්ග කිහිපයක තොග සඳහා තොග ගිණුම් නොපවත්වා මිලදී ගැනීම් එම අලෙවි ආදායමට හිලව් කර දැක්වීම.
  - 2011 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගතකර තිබූ එහෙත් භෞතිකව නොපැවති රු.3,481,306 ක් වටිනා තොග සම්බන්ධයෙන් නිවැරදි කිරීමේ කටයුතු සිදු නොකිරීම.
  - තොග නිකුත් කිරීම් ගිණුම්ගත නොකරන අවස්ථා තිබීම.
  - ජාතික පොත් සංචිතයට එකතු කරනු ලබන තොග ගිණුම්ගත කිරීමට කටයුතු නොකිරීම.
  - තොග වර්ග තුනක 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා ගබඩා තොග ලේඛන අතර ශේෂයන්හි රු.12,212,011 ක් වූ වෙනස්කම් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු නොකිරීම.

(ii) <u>ස්ථාවර වත්කම් පාලනය</u>

ස්ථාවර වත්කම් ලේඛන නොපැවැත්වීම, ස්ථාවර වත්කම් වර්ගීකරණ ලෙජරයක් නොපැවැත්වීම, මණ්ඩලයේ අංශ තුළ ඉන්වෙන්ට්‍රි ලේඛන නොපැවැත්වීම, ගබඩා බඩු ලේඛන පොත අසම්පූර්ණවීම, 2013 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් සමීක්ෂණයක් සිදු නොකිරීම, පෙර වර්ෂයේ හඳුනාගන්නා ලද පාවිච්චි කළ නොහැකි

භාණ්ඩ ඒකක 391 ක් සම්බන්ධයෙන් වූ නිර්දේශ ක්‍රියාත්මක කළ බවට වාර්තා නොකිරීම යනාදී කරුණු හේතුවෙන් ස්ථාවර වත්කම් සම්බන්ධ අභ්‍යන්තර පාලනය අසතුටුදායක තත්ත්වයේ පැවතුණි.

(iii) **ලිපිලේඛණ නඩත්තුව**

මණ්ඩලයේ විවිධ වැඩසටහන්වලට අදාළ ලියකියවිලි හා ලේඛන නඩත්තු කිරීම සඳහා විධිමත් පාලන පරිපාටීන් හඳුන්වා නොදීම හේතුවෙන් එම වැඩසටහන්වලට අදාළ වියදම්, ආදායම් ආදී තොරතුරු, කාර්යසාධන වාර්තා, ආංශික ප්‍රගති වාර්තා හා වැය ලෙජර් අතර සැසඳීමේදී ප්‍රමාණාත්මක නොසැසඳීම් නිරීක්ෂණය විය.

(iv) **මූල්‍ය පාලනය**

සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලයට අදාළ රු.1,050,232 ක දෛනික ලැබීම් බැංකුවේ තැන්පත් කිරීමට දින 02 සිට දින 23 ක් දක්වා කාලයක් ප්‍රමාද කර තිබීම, 2013 අප්‍රේල් 26 දින මුදල් භෞතික පරීක්ෂාවේදී රු.14,203 ක මූල්‍ය ඌනතාවයක් පැවතීම, රු.9,064 ක් වූ උපලබ්ධි නොවූ මුදල් ඇනවුම් සම්බන්ධයෙන් කටයුතු නොකිරීම ආදි කරුණු හේතුවෙන් මණ්ඩලයේ මූල්‍ය පාලනය අසතුටුදායක තත්ත්වයේ පැවතුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික පුස්තකාලයේ වාර්ෂිකව වර්ධනය වූ පොත් සංඛ්‍යාව, පාඨක සංඛ්‍යාව හා පුස්තකාල සේවාවන්වලට සරිලන ආකාරයට පුස්තකාලයේ ඉඩකඩ ප්‍රමාණය හා අනෙකුත් භෞතික සම්පත් වර්ධනය නොවීම සහ නඩත්තු සහ පරිපාලන කටයුතුවල දුර්වලතාවයන් හේතුවෙන් පුස්තකාල පරිහරණයේදී ගැටළු සහගත තත්ත්වයක් ඇතිවී තිබූ අතර වසර ගණනාවකට පෙර රු.887,906 ක වියදමකින් සකස්කල පුස්තකාල ගොඩනැගිල්ල ප්‍රතිනිර්මාණය කිරීමේ සැලසුම් ක්‍රියාත්මක නොකිරීම නිසා එම වියදම ද නිෂ්කාර්යය වියදමක් වී තිබුණි.

(ආ) ජාතික පොත් සංචිතය සඳහා අත්පත් කරගනු ලබන පුස්තකාල සම්පත් පාඨක පරිහරණය සඳහා පාඨක සේවා අංශයට යොමු කිරීමේදී අසාමාන්‍ය කාල ප්‍රමාදයක් ඇතිවී තිබුණි. ඒ බව පරිග්‍රහණ අංක 177,938 සිට 192,504 දක්වා වූ අත්පත් කරගැනීම් මාස 03 සිට අවුරුදු 02 කට අධික කාලයක් සහ 2013 ඔක්තෝබර් සිට 2014 පෙබරවාරි මාසය දක්වා කාලය තුල අත්පත් කරගත් රු.199,903 ක් වටිනා දුර්ලභ ප්‍රකාශන 45 ක් වසරකට අධික කාලයක් ගතවීමෙන් පසු පාඨක සේවා අංශයට යොමු කිරීමෙන් පැහැදිලි විය.

**3.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට 197 ක් වූ අනුමත සේවක සංඛ්‍යාවෙන් තනතුරු 55 ක් පුරප්පාඩු වී පැවති අතර කළමනාකරණ මට්ටමේ තනතුරු 05 ක් සඳහා වසර කිහිපයක සිට වැඩ බැලීමේ පත්වීම් ලබාදී තිබුණි.

(ආ) 2011 සැප්තැම්බර් 16 දින අනුමත කරන ලද නව බඳවා ගැනිමේ පරිපාටියේ ඇතුළත් බඳවා ගැනිම් හා උසස්වීම් තනතුරු 23 ක් සඳහා අවම වශයෙන් වසරකට එක් වතාවක් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ඒ සඳහා කටයුතු කර නොතිබුණි.

(ඇ) පෞද්ගලික ලිපිගොනුවලට ඇතුළත් කර තිබූ අධ්‍යාපන සහතික සනාථ කරගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-------------------------------------------

### 4.1 අභ්‍යන්තර විගණනය

------------------------

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 1998 පෙබරවාරි 13 දිනැති අභ්‍යන්තර විගණන චක්‍රලේඛ අංක 98/1 ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තා විගණන කමිටුව වෙතද කරන ලද වැඩ පිළිබඳ වාර්තා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයට හා විගණකාධිපතිට පිටපතක් සහිතව අමාත්‍යාංශ ලේකම් වෙතද ඉදිරිපත් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ විගණන වැඩසටහනෙහි ඇතුළත් 1708 ක් වූ මුළු මානව සම්පත් පැය ගණනින් මානව සම්පත් පැය 1148 ක් ඇතුළත් විෂය ක්ෂේත්‍රයන් 04 කට අදාළ විගණන කාර්යයන් කිසිවක් සමාලෝචිත වර්ෂය තුළ ඉටුකර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

(අ) ගිණුම්කරණය හා මූල්‍ය පාලනය
(ආ) ස්ථාවර වත්කම් පාලනය
(ඇ) ගබඩා පාලනය
(ඈ) සැලැසුම්කරණය, අයවැය පාලනය හා කාර්යසාධනය
(ඉ) ප්‍රසම්පාදන කටයුතු